සමන්තුරෙයි ප්‍රාදේශීය සභාව - 2024

--

1 මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සමන්තුරෙයි ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට සමන්තුරෙයි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ සිදුකළ ගොඩනැගිලි ඉදිකිරීම හා මිලදී ගැනීම් රු.19,786,215ක් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ලෙස හා කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	මෙම වර්ෂයේ අප්‍රේල් මාසය ආරම්භයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබී කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කර තිබුණි. මෙම කරුණ මෙම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයෙන් නිවැරදි කරන බව.	සමාලෝචිත වර්ෂයේ අවසන් වූ බැවින් ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල් මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කිරීමට පියවර ගත යුතුය.
(ආ)	සභාව විසින් පරිහරණය කරනු ලබන ඉඩම් හා ගොඩනැගිලි 65ක්, යතුරු පැදි 03ක්, වාහන 17ක් සහ ට්‍රේලර් 09ක් ප්‍රත්‍යාගණනය කර එහි තථ්‍ය වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	මේවා සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව.	කඩිනමින් දේපල ප්‍රත්‍යාගණනය කර එහි තථ්‍ය වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා ලැබිය යුතු උසාවි දඩගාස්තු රු.2,857,828ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.1,680,559ක් ලෙස දක්වා තිබුණි.	සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ප්‍රමාණයෙන් සැප්තැම්බර් හා ඔක්තෝබර් මාස සඳහා වටිනාකමත් 2025 ජනවාරි මාසයේ බැංකුවේ ඍජුව තැන්පත් කිරීම දෝෂයකින් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කෙරුණි. ඉදිරි වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශනයේ ගැලපීම් සිදු කරන බව.	ලැබිය යුතු උසාවි දඩ ගාස්තු සම්පූර්ණ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය.
(ඈ)	2023 නොවැම්බර් සිට 2024 දෙසැම්බර් දක්වා ලැබිය යුතු හිඟහිටි මුද්දර ගාස්තු ආදායම් ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	2024 ජනවාරි - මැයි දක්වා ගාස්තු පිරික්සීම සඳහා ලියකියවිලි එවා ඇති අතර ජුනි සිට දෙසැම්බර් දක්වා විස්තර ඉඩම් දෙපාර්තමේන්තුවෙන් ලබාදී නොතිබුණු බව.	සභාවේ මූල්‍ය, පාලන රෙගුලාසිවලට ප්‍රකාරව, සෑම කාර්තුවකට වරක් මුද්දර ගාස්තු ආදායම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය.

(ඉ)	පොදු වෙළෙඳපොල බදුකුලී ආදායම් රු.190,027ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර තිබුණි.	මල්වත්ත පොදු වෙළෙඳපොල බදු නොදීම නිසා සභාවේ නිලධාරියෙකු විසින් අයකළ රු. 190,027ක් ආදායම මූල්‍ය ප්‍රකාශනයේ අනාවරණය කර තිබුණි. ලබන වසරේ සමුච්චිත අරමුදල ආශ්‍රයෙන් නිවැරදි කරනු ලබන බව.	තථ්‍ය වශයෙන් ඉපැයූ ආදායම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය.

1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ සභාව විසින් පවත්වා තිබූ ලේඛනවල පවතින ශේෂ හා මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය අතර රු.1,548,099ක වෙනසක් පැවැතුණි.	මස්කඩ බදුකුලී ලේඛන ශේෂ මූල්‍ය ප්‍රකාශනයේ ශේෂ සමග සැසඳීමටත් අත්තිකාරම් ලෙස ලබාදුන් රු.548,086ක් කපාහැරීමටත් පියවර ගෙන ඇති බව.	ලේඛනවල පවතින ශේෂ හා මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය අතර පවතින වෙනස්කම් හඳුනා ගෙන නිවැරදි කිරීමට කඩිනමින් පියවර ගතයුතුය.

1.6.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 ජූනි 26 දින සභාව විසින් විශ්‍රාම වැටුප් දායක මුදල් ලෙස රු.1,500,000ක් ගෙවා තිබූ නමුත්, එම වටිනාකම සඳහා සේවක විස්තර, හිඟහිටි ශේෂය හා ගෙවිය යුතු කාලය ආදි සනාථ කිරීමේ ලිපිලේඛන සභාවේ නොපැවැතුණි.	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ලිපිය වෙනුවෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සිදුකළ විමසීමට අනුව 1993 සැප්තැම්බර් 03 දිනට ප්‍රථම පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සේවය කළ සේවකයින්ගේ විස්තර සමන්තුරේ, ඉරක්කාමම් සහ නාවිදන්වෙලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසීම් කළ නමුත් විස්තර ලබාගත නොහැකි විය.	ගෙවීම් කිරීමට ප්‍රථම ඒ සඳහා ලිපිලේඛන තහවුරු කිරීමෙන් පසුව ගෙවීම් සිදුකළ යුතුය.

1.7 අනුකූල නොවීම

1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 136 වගන්තිය	සභා බලප්‍රදේශයේ පිහිටි රජයට අයත් ආයතනවල ඉඩම් හා ගොඩනැගිලිවල	එම රජයේ ආයතන වෙත වාර්ෂිකව K ආකෘති පත්‍ර යවනු ලබන අතර ඇතැම්	පනතේ විධිවිධාන ප්‍රකාරව, සුදුසු රජයේ ආයතනවලින්

		වටිනාකම එකතුව රු.669,615කට තක්සේරු කර තිබූ නමුත්, එම ආයතනවලින් වරිපනම් බදු අයකිරීමට සභාව විසින් පියවර ගෙන නොතිබුණි.	ආයතන නිසි පරිදි ගෙවනු ලබයි. නමුත් ඇතැම් ආයතන මේ පිළිබඳ නොසැලකිලිමත්ව සිටින බව.	වරිපනම් බදු අයකිරිමට පියවර ගතයුතුය.
(ආ)	1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පාලන රීති මාලාව			
	(i) 81 රීතිය	සෑම කාර්තුවක් අවසානයේදීම ඉඩම් ගනුදෙනු පිළිබඳ මුද්දර ගාස්තු ප්‍රතිපූර්ණය කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍ර රෙජිස්ට්‍රාර් ජෙනරාල් වරයාට යැවීමට පියවර ගෙන නොතිබුණි.	අදාල කරුණ සම්බන්ධයෙන් ලිපි යවා ඇත. ඉදිරියේදී කාර්තුවකට වරක් ලිපි යැවීමට පියවර ගනු ලබන බව.	මූල්‍ය හා පාලන රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය.
	(ii) 193 රීතිය	සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම්, අයවැය ඇස්තමේන්තු සමග සසඳා විචලනයන්ට පැහැදිලි කිරීම් ඇතුළත් ප්‍රකාශය සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	විචලනයන්ට පැහැදිලි කිරීම් ඇතුළත් ප්‍රකාශය සකස් කර විගණනයට ඉදිරිපත් කිරීමට පියවර ගනු ලබන බව.	-එම-
(ඇ)	2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 මාර්ගෝපදේශය	එකතු කළ අගය මත බදු ගෙවීමෙන් පසු ඒ පිළිබඳ විස්තර ඊළඟ මාසයේ 15 දින හෝ ඊට පෙර විගණකාධිපතිවරයාට දැනුම් දිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ කොන්ත්‍රාත්කරුවන් 04කට ගෙවා තිබූ එකතුව රු.9,112,103ක් සම්බන්ධයෙන් වාර්තා කර නොතිබුණි.	ඉදිරියේදී විගණකාධිපතිවරයාට යැවීමට පියවර ගනු ලබන බව.	එකතු කළ අගය මත බදු පිළිබඳ වාර්තාව විගණකාධිපතිවරයාට දැනුම් දීමට පියවර ගතයුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ වියදම (ඌනතාවය) රු.14,623,497ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම රු. 10,472,491 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව සභාව විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
(i)	වරිපනම් හා බදු	10,828,281	37,670,629	10,030,618	27,640,010	8,050,000	33,030,053	8,963,938	24,066,115
(ii)	කුලී	45,445,189	39,420,517	37,572,722	1,847,795	44,936,120	40,938,912	38,787,204	2,151,708
(iii)	බලපත්‍ර ගාස්තු	2,600,000	1,964,700	1,964,700	-	3,080,000	2,156,700	2,136,300	20,400
(iv)	වෙනත් ආදායම්	13,560,720	8,069,198	8,069,198	-	11,684,000	5,762,913	5,762,913	-
		72,434,190	87,125,044	57,637,238	29,487,805	67,750,120	81,888,578	55,650,355	26,238,223

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය සඳහා දේපළ බදු ආදායම් ලෙස රු.9,578,281 ක් ඇස්තමේන්තු කර තිබූ නමුත් ඉන් රු.1,094,198ක් පමණක් අයකර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමින් සියයට 11 ක් විය.	වරිපනම් බදු අයකිරිමේදී පසුගිය වර්ෂයේ හිඟමුදල් ඇතුළත්ව අයකිරිම් සිදුකෙරේ. මේවා අයකිරිමට පියවර ගෙන ඇති බව.	ඇස්තමේන්තු කළ සියළු ආදායම් කාර්යක්ෂමව අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	පසුගිය වර්ෂය දක්වා හිඟ වරිපනම් හා බදු රු.24,066,115 ක් පැවැති නමුත් ඉන් රු.8,819,457ක් පමණක් සමාලෝචිත වර්ෂයේ අයකර ගෙන තිබුණි. එය හිඟමුදලින් සියයට 37 ක්ව පැවැතුණි.	RI නිලධාරී හිඟය මෙම ගැටළු මතුකර තිබුණි. වර්තමානයේ සෑම කොට්ඨාශයක් වෙනුවෙන් වෙන වෙනම නිලධාරීන් පත්කර අයකිරීම් සිදු කරනු ලබන බව.	හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	පසුගිය වර්ෂ දක්වා වූ කඩකාමර හිඟකුලී රු.288,978ක් අයකර ගැනීමට පියවර ගෙන	එම හිඟහිටි අයකර ගැනීමට ලිපි යැවීම මගින් හා දුරකථන ඇමැතුම්	-එම-

	නොතිබුණි.	මගින් අයකර ගැනීම් සිදුකරන අතර එසේ අයකළ නොහැකි හිඟමුදල් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	
(ඈ)	මස් කඩකුලී ලේඛනය ප්‍රකාරව පසුගිය වර්ෂවල හිඟශේෂය රු.586,870ක් පුද්ගලයින් 05 කගෙන් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.	හිඟහිටි මස්කඩ බදුකුලී අයකර ගැනීම සඳහා හිඟ බදුකරුවන් 12 කට එරෙහිව නඩු පවරන ලෙසට නීතිඥවරයාට ලිපියක් යවා ඇති බව.	-එම-
(ඉ)	සමන්තුරෙයි පොදු වෙළඳපොළ බදුකුලී හිඟ මුදල් රු.819,660 ක් පැවැති අතර එම මුදල බදුකරුගෙන් වර්ෂ 03 ක සිට අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.	2022 වර්ෂයේදී පොදු වෙළඳපොළ විවෘත භූමි පරිශ්‍රය බදු ලබාගෙන රු.819,660.00 ක හිඟ මුදල් ගෙවා නොමැතිව විදේශගත වීම හේතුවෙන් වර්තමානයේ අයකිරීමට පියවර ගෙන ඇති බව.	-එම-
(ඊ)	සමාලෝචිත වර්ෂයේ වෙළඳසැල් 1,178 ක් සඳහා වෙළෙඳ බලපත්‍ර ගාස්තු රු.2,052,900 ක් අයකර තිබූ නමුත්, ඉන් කඩකාමර 50 කට වෙළෙඳ බලපත්‍ර සහතික නිකුත් කර නොතිබුණි.	අදාළ පුද්ගලයින් විසින් නිවැරදි ලියකියවිලි ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, වෙළෙඳ බලපත්‍ර සහතික ඇතැම් අයට නිකුත් කර නොමැති බව.	සමාලෝචිත වර්ෂය තුළ වෙළෙඳ බලපත්‍ර අදාළ නීතිරීතිවලට අනුව නිකුත් කිරීමට පියවර ගත යුතුය.
(උ)	සභාව විසින් 2023 නොවැම්බර් සිට 2024 දෙසැම්බර් දක්වා මාස 14කට අදාල මුද්දර ගාස්තු නියමිත කාලපරිච්ඡේදයේ ගණනය කර ඉල්ලුම් කිරීමට කටයුතු කර නොතිබුණි.	2023 නොවැම්බර් සිට දෙසැම්බර් මාස දක්වා කාලපරිච්ඡේදයට මුද්දර ගාස්තු ලබාගැනීමට ඉල්ලුම් කර ඇති අතර, 2024 ජනවාරි සිට මැයි දක්වා මුද්දර ගාස්තු තහවුරු කිරීම සඳහා ඉඩම් දෙපාර්තමේන්තුවට යවා ඇති බව.	නියමිත කාල පරාසය තුළ තොරතුරු රැස් කළ යුතු අතර කඩිනමින් අයකර ගැනීමට පියවර ගත යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව විසින් 2020 ජුනි 17 සිට 2024 දෙසැම්බර් 31 දක්වා ලබාදුන් අත්තිකාරම් රු.1,893,574 ක් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් නිරවුල් කර නොතිබුණි.	ආයතනයකට ලබාදුන් රු.1,217,500.00 ක්ද, 2003 වර්ෂයේ සිට ලබාදුන් අත්තිකාරම් රු.548,086 ක්ද ඇතුළත් වේ. ඉන් රු.548,086 ක්ද කපාහැරීමට පියවර ගෙන ඇති බව.	අත්තිකාරම් ලෙස ලබාදුන් මුදල් අදාල අයගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**දේපළ බදු**		
	සමාලෝචිත වර්ෂය අවසානයේ රු.27,640,010 ක ශේෂයක් පැවැතුණද, එම ශේෂ කාලය අනුව වර්ගීකරණය කර අයකිරීමට සහ නීතිමය පියවර ගැනීමටත් කටයුතු කර නොතිබුණි.	දේපළ හිමියන්ගේ ශේෂයන් පිළිබඳව ශබ්ද විකාශන යන්ත්‍ර මගින් නිවේදන නිකුත් කරනු ලබන අතර ජංගම සේවා හරහාත් අයකිරීම් සිදු කෙරෙන බව.	හිඟහිටි දේපළ බදු කාලය අනුව වර්ගීකරණය කර සුදුසු ක්‍රියාමාර්ග ගෙන අයකර ගැනීමටත් පියවර ගත යුතුය.
(ආ)	**කඩකුලී හා බදුකුලී** සභාවේ කඩ කාමර 84ක් සහ සමන්තුරෙයි පොදු වෙළඳපොළ සඳහා ලංසු කැඳවීමකින් තොරව දීර්ඝ කාලයක් තිස්සේ ඇතැම් නිශ්චිත පුද්ගලයින් විසින් කුලියට ගෙන තිබුණි. එම කඩ සඳහා ප්‍රසිද්ධියේ ලංසු කැඳවීමක් සිදුකර ආදායම ඉහළ නංවා ගැනීමට පියවර ගෙන නොතිබුණි.	කඩකාමර වෙනුවෙන් ඉඩම් ලබා දී ඇති පුද්ගලයින් 14 දෙනෙකු සිටිති. ඔවුන්ට අඛණ්ඩව කඩකාමර ලබා දී ඇති අතර අනෙකුත් කඩකාමරවලින් හිස්ව පවතින කඩකාමර වෙනුවෙන් 2024 මාර්තු 11, 2024 ඔක්තෝබර් 25, 2025 පෙබරවාරි 18 දිනවල ලංසු කැඳවා ඇති බව.	කඩකාමර සහ සමන්තුරෙයි පොදු වෙළඳපොළ සැමට ලබා ගත හැකි වන පරිදි ප්‍රසිද්ධ ලංසු කැඳවීම සිදු කළ යුතුය.
(ඇ)	2023 වර්ෂයේදී කාබනික පොහොර නිෂ්පාදනය වැඩිදියුණු කිරීමේ අරමුණින් පොහොර රෝල් කිරීමේ යන්ත්‍රයක් සඳහා රු.1,700,000 ක් සහ සමාලෝචිත වර්ෂයේ වහලය ඉදිකිරීම සඳහා රු.10,124,136 ක් වැය කර තිබූ නමුත්, අදාල ව්‍යාපෘතියේ අරමුණ ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි.	පොහොර රෝල් කිරීමේ යන්ත්‍රය හා එම ස්ථානයේ වහල ඉදිකිරීමේ ව්‍යාපෘතිය අවසන් කර ඇති අතර වර්තමානයේ ජනතාවගෙන් දිරන අපද්‍රව්‍ය එකතු කර කාබනික පොහොර නිෂ්පාදන සිදු කෙරෙමින් පවතින බව.	අදාල අරමුණ ඉටුකර ගැනීම සඳහා කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය.

3.3 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව විසින් භාවිතා කරන වාහන 05 ක්, ගොඩනැගිලි 34ක් සහ ඉඩම් කැබැලි 31 ක් පැවැති නමුත් එහි අයිතිය සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	සභාව භාවිතා කරනු ලබන වාහන 05 හිමිකාරිත්වය මාරු කිරිමේ ක්‍රියාවලීන් සිදුවෙමින් පවතී. ඉඩම් හා ගොඩනැගිලි පවරා ගැනීමේ කටයුතු ප්‍රාදේශීය ලේකම් වරයා විසින් සිදුකරමින් පවතින බව.	වත්කම්වල අයිතිය සභාවේ නමට පවරා ගැනීමට පියවර ගත යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ කඩ කාමර 25 ක් සහ මස්කඩ 02ක් කුලියට දීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.	හිස්ව පවතින කඩ කාමර 2024 මාර්තු 11, 2024 ඔක්තෝබර් 25, 2025 පෙබරවාරි 18 යන දිනවල කඩකාමර 03ක් සඳහා පමණක් ලංසු කැඳවා ඇත. තවද, මස්කඩ 02න් එකක් කුලියට ලබාදී ඇති බව.	සියළුම කඩකාමර සඳහා ලංසු කැඳවා කුලියට ලබා දී ආදායම් ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතුය.

3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
අපජල පිරිපහදු ව්‍යාපෘතිය අපජල පිරිපහදුව සඳහා රු. 25,717,122 ක් වැය කර තිබූ නමුත්, අභ්‍යන්තර මාර්ග පූර්ණ ලෙස නිම කර නොතිබුණි. තවද, එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කාර්ය මණ්ඩල පුහුණුව, වගකීම් සහතිකය සහ අලෙවියෙන් පසු සේවාව පිළිබඳව වගකිව යුතු පාර්ශව වැනි කාරණා ඇතුළත් වන පරිදි නිසි ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.	වැඩ අවසන් කළද, සමහර මෙහෙයුම් කටයුතු අවසන් කර නොතිබුණි. ප්‍රමාණවත් සම්පත් නොමැතිකම හේතුවෙන් ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමාදයක් ඇති වූ බව.	අඩුපාඩු සම්පූර්ණ කරගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කඩිනම් පියවර ගත යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාවේ තනතුරු 13ක් සඳහා පුරප්පාඩු 39ක් සහ අතිරික්ත කාර්ය මණ්ඩලය 07ක් පැවැති නමුත් එය වාර්ෂික ස්ථානමාරු මගින් පිරවීමට පියවර නොගැනීමෙන් සභාව විසින් ජනතාවට සපයනු ලබන පොදු	සභාවේ තනතුරු 13කින් තනතුරු 02ක් හැර අනෙකුත් ඒවාට පුරප්පාඩු පැවැති නමුත් එම පුරප්පාඩු නොපුරවා පැවැති අතර මෙම නිලධාරීන්ට ස්ථානමාරු නොමැති බැවින් එමගින්	සභාවට අවශ්‍ය කාර්ය මණ්ඩල පුරප්පාඩු පුරවාගෙන මහජන සේවාවන් අඛණ්ඩව පවත්වා ගත යුතුය.

	සේවාවන් සහ මහජන සෞඛ්‍ය සේවාවන් අකාර්යක්ෂමව පැවැති බව නිරීක්ෂණය විය.	ගැලපීමට නොහැකිව පවතින බව.	
(ආ)	නිලධාරීන් 10කගෙන් අයවිය යුතු රු.108,550 ක හිඟණය ශේෂ අදාල පුද්ගලයන්ගෙන් හෝ ඇපකරුගෙන් අයකර ගෙන නොතිබුණි.	නිලධාරීන්/ඇපකරුවන්ගෙන් විශ්‍රාම ලබාගිය නිලධාරීන්ට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත දැනුම් දී හිඟණය මුදල් අයකර ගැනීමට පියවර ගෙන ඇති බව.	නිලධාරීන්ගෙන් අයකළ යුතු ණය මුදල අදාළ පුද්ගලයන්ගෙන් හෝ ඇපකරුගෙන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව විසින් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීමට නිලධාරීන් 03ක් පත්කර තිබුණ ද 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය හා මුදල් රෙගුලාසි 133 හා 134 ප්‍රකාරව අභ්‍යන්තර විගණනය මගින් ආයතන මෙහෙයුම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය සහ කාර්යාසාධනය ඉහළ නැංවීම සඳහා නිර්දේශ සකස් කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන කමිටුව සෑම මසකම රැස්වන අතර සෑම වවුචරයක්ම පරීක්ෂා කර සභාවේ ඉදිරිපත් කරන ලබන බව.	අභ්‍යන්තර විගණන කාර්යයන් නිසි පරිදි ඉටුකර සභාවේ මෙහෙයුම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය සහ කාර්යසාධනය වර්ධනය කිරීමට නිර්දේශ සකස් කළ යුතුය.

4.2 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ ඇස්තෙම්න්තුගත ආදායම රු.217,611,329ක් සහ ඉපැයූ ආදායම රු.143,346,130ක් විය. මේ අනුව ඇස්තමේන්තුගත ආදායමින් රු.74,265,199 ක් ලැබී නොතිබුණි.	අයවැය අපේක්ෂිත ඇස්තමේන්තුවක් වන බැවින්, පසුගිය සහ සමාලෝචිත වර්ෂ සත්‍ය ආදායම් මූලාශ්‍ර සහ වියදම් සැලකිල්ලට ගනිමින්, ඉදිරි වර්ෂය සඳහා අයවැය හැකිතාක් නිවැරදිව සකස් කිරීමට පියවර ගනු ලබන බව.	සභාවේ ආදායම නිවැරදිව හඳුනාගෙන අයවැය සකස් කිරීමට සහ ඒවා ඵලදායී ලෙස රැස් කිරීමටත් පියවර ගත යුතුය.

4.3 පරිසර ගැටළු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව විසින් පවත්වාගෙන යනු ලබන ඝාතකාගාරය සඳහා පාරිසරික බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඝාතකාගාරය සඳහා බලපත්‍ර අළුත් කිරීමට කටයුතු කර ඇති බව.	පරිසර බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

4.4 තිරසාර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීමටත්, මැනීම සඳහා දර්ශක ස්ථාපිත කිරීමටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	සන අපද්‍රව්‍ය බැහැර කිරීම, පරිපාලන විෂයන්, පොදු උපයෝගිතා, සුභසාධක වියදම් සියල්ල තිරසාර සංවර්ධන අරමුණු ළඟාකරගත හැකි අයුරින් සකසා ඇත. මේ අනුව තිරසාර සංවර්ධන අරමුණු වෙනමම අයවැයෙන් මූල්‍ය ප්‍රතිපාදන සලසා වෙනමම ආකෘතියක් මගින් ද සකස් කර දක්වා ඇති බව.	2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනත යටතේ, තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා ගත යුතුය.